# 1.විනය

- විවිධ විසෙස නයතතා- විනයනතො චෙව කායවාචානං

  විනයතථවිදූහි අයං- විනයො විනයොති අකඛාතො

- විවිධ විශේෂ නය ක්‍රම ඇති බැවින්ද කය වචනය හික්මවන බැවින්ද විනයාර්ථයන්හි පණ්ඩිතයන් විසින් විනය යැයි කියනු ලැබේ.

# 2.විනය පැනවීමේ ප්‍රයෝජන

- සංඝසුටඨුතාය (සංඝයාගේ යහපත පිණිස)
- සංඝඵාසුතාය (සංඝයාගේපහසුව පිණිස)
- දුමමංකූනං පුගගලානං නිගගහාය
  (දුසිල්වතුන්ට නිග්‍රහ කිරීම පිණිස)
- පෙසලානං භිකඛූනං ඵාසුවිහාරාය
  (සිල්වත් භික්ෂූන්ගේ පහසුව පිණිස)
- දිටඨධමමිකානං ආසවානං සංවරාය (මෙලොව වශයෙන් අසංවරයෙන් ඇතිවන දුක්විපාක නැතිවීම පිණිස)
- සමපරායිකානං ආසවානං පටිඝාතාය ( පරලොව වශයෙන් අසංවරයෙන් ඇතිවන දුක් විපාක නැතිවීම පිණිස)
- අපපසනනානං පසාදාය (නොපැහැදුනු අයගේ පැහැදීම පිණිස)
- පසනනානං භියොභාවාය (පැහැදුණු අයගේ වැඩිදියුණුවීම පිණිස)
- සදධමමටඨිතියා (ධර්මයේ පැවැත්ම පිණිස)
- විනයානුගගහාය (විනයට අනුග්‍රහ පිණිස)

# 4.ආසවටඨානීය ධර්ම

- රතතඤ්ඤූ මහනතතාව (සාසනය ඇරඹී දිගු කලක් ගතවීම)
- වෙපුලල මහනතතාව (සසුනෙහි සඝ පිරිස වැඩිවීම)
- ලාභගග මහනතතාව (සසුනට ලාභ සත්කාර වැඩිවීම)
- බාහුසචච මහනතතාව (සසුනෙහි බහුශ්‍රැතයන් වැඩිවීම)

# 5.සංඝ

සම්මුති සංඝ → දකඛිණෙයයා සංඝ

- චතුවාර්ගික සංඝ
- පංචවාර්ගික සංඝ
- දසවාර්ගික සංඝ
- වීසති වාර්ගික සංඝ
- අතිරේක වීසතිවාර්ගික සංඝ

මෙයින් වීසති හා අතිරේකවීසති සංඝයාට අබ්භාන ආදී සියලු විනයකර්ම කල හැකිය.

දසවාර්ගික සංඝයාට අබ්භාන හැර මධ්‍ය දේශයේ උපසම්පදාව ආදී සියලු විනයකර්ම කල හැකිය.

පංචවාර්ගික සංඝයාට අබ්භාන හා මධ්‍ය දේශයේ උපසම්පදාව හැර ප්‍රත්‍යන්ත දේශවල සියලු විනයකර්ම කල හැකිය.

චතුවාර්ගික සංඝයාට අබ්භාන,මධ්‍ය දේශයේ උපසම්පදාව. ප්‍රත්‍යන්ත දේශවල උපසම්පදා පවාරණය හැර පිරිවෙස් දීම, මානත් දීම, උපෝසථ ආදී අනෙක් සියලු විනයකර්මකල හැකිය.

# 6.ප්‍රාතිමෝක්ෂය

ඕවාද ← ප්‍රාතිමෝක්ෂය → ආණා

ආණා → සීල

ආණා → ග්‍රන්ථ → භික්ඛු

ග්‍රන්ථ → භික්ඛුණී

# 7.ඕවාද ප්‍රාතිමෝක්ෂය

මෙම ප්‍රාතිමෝක්ෂය සම්මා සම්බුදු රජාණන් වහන්සේලා පමණක් දේශනා කරනු ලබයි. ආඥා ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමට ප්‍රථම අවුරුදු විස්සක් වූ මුල් කාලය තුල 'සබබ පාපසස අකරණං' , 'ඛනතී පරමං තපො තිතිකඛා' , 'අනුපවාදො අනුප ඝාතො' ආදී වශයෙන් සිදුකරනු ලැබූ අවවාදාත්මක ගාථාවන්.

# 8.ආණා ප්‍රාතිමෝක්ෂය

බුදුරජාණන් වහන්සේලා විසින් අවවාද ස්වරූපයෙන් බැහැරව නීතියක් සේ පනවා වදාරණ ලද ශික්ෂා සමූහය ආණා ප්‍රාතිමෝක්ෂයයි. මෙය ශීල ප්‍රාතිමෝක්ෂය ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය වශයෙන් ආකාර දෙකකි.

1. ශීල ප්‍රාතිමෝක්ෂය

' ආදිමෙතං, මුඛමෙතං, පමුඛමෙතං කුසලානං ධමමානං තෙන වුචචති පාතිමොකඛං' ආදි ලෙස ශීල ප්‍රාතිමෝක්ෂය දක්වා ඇත.මෙය ආභිසමාචාරික ශීලය, හා ආදි බ්‍රහ්මචරියක ශීලය වශයෙන් ආකාර දෙකකි.

- ආභිසමාචාරික ශීලය

සප්ත ආපත්තිස්කන්ධ අතුරින් දුක්කට, දුබ්භාසිතන ආපත්ති ස්කන්ධ යටතේ එන පැනවීම් මේ යටතේ සංග්‍රහ වේ.

- ආදිබ්‍රහ්මචරියක ශීලය

සප්ත ආපත්තිස්කන්ධ අතුරින් පාරාජිකා, සංඝාදිසේස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේශනීය යන පංච ආපත්තිස්කන්ධ යටතේ සංග්‍රහ කළ සිකපද සමූහය හෙවත් ප්‍රාතිමෝක්ෂය ආදිබ්‍රහ්මචරියක ශීලයයි.

2. ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය

'උභයානි ඛො පනසස පාතිමොකඛානි විතථාරෙන සවගතානි හොනති' ආදී ලෙස ග්‍රන්ථප්‍රාතිමෝක්ෂය දක්වා ඇත.මෙය භික්ඛු ප්‍රාතිමෝක්ෂය හා භික්ඛුණී ප්‍රාතිමෝක්ෂය ලෙස දෙවැදෑරුම් වේ.

| | |
|---|---|
| පාරාජිකා | 4 |
| සංඝාදිසේස | 13 |
| අනියත | 02 |
| නිසැගි පචිති | 30 |
| ශුද්ධ පචිති | 92 |
| පාටිදේසනීය | 04 |
| සේඛියා | 75 |
| ශික්ෂාපද | 220 |
| අධිකරණ සමථ | 07 |

1-භික්ඛු ප්‍රාතිමෝක්ෂය - උද්දේස (05)

- නිදානුද්දේසය
- පාරාජිකුද්දේසය
- සංඝාදිසේසුද්දේසය
- අනියතුද්දේසය
- විත්ථාරුද්දේසය

2-භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයෙහි අනියතුද්දේසය හැර උද්දේස 4 කි.

පාරාජිකා 08, සංඝාදිසේස 17, නිසැගි පචිති 30, ශුද්ධ පචිති 166, පාටිදේසනීය 08, සේඛියා 75, අධිකරණ සමථ 07=311